# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1563/2 - 2008 අගෝස්තු 18 වැනි සඳුදා - 2008.08.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 23 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2008 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ දීය.

### නියමාවලිය

1. මෙම නියමාවලිය 2008 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල (සංශෝධන) නියමාවලිය ලෙස හඳුන්වනු ලැබෙන අතර, 2007 අගෝස්තු මස 06 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

2. කලින් කල සංශෝධිත සහ අවසන් වරට 2007 අගෝස්තු මස 20 වන දින අංක 1511/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1990 ජනවාරි මස 05 දින අංක 591/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල නියමාවලියේ 18 වන ඡේදයේ (2) වන උප ඡේදයේ (iv) වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම නියමාවලිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(iv) පීඨය සමන්විත වන අධ්‍යයන අංශවල සියලු ස්ථිර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සහ කථිකාචාර්යවරුන් ;".